SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# AA2 විභාගය - 2018 ජූලි

# ප්‍රශ්න සහ යෝජිත උත්තර
# විෂය අංක (AA25)

## ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම
## (BLE)


**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

අංක 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669



**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.**

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

## AA2 විභාගය - 2018 ජූලි
## (AA25) ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම

## යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

අනිවාර්ය ප්‍රශ්න දහයකි. (10)

(මුළු ලකුණු 20)

### 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්නය | උත්තරය |
|---|---|
| 1.1 | (2) |
| 1.2 | (3) |
| 1.3 | (4) |
| 1.4 | (4) |
| 1.5 | (2) |
| 1.6 | (1) |
| 1.7 | (2) |

1.8 **පහත සඳහන් ඒවා අතුරෙන් ඕනෑම දෙකක්:**

a. දේපළ සම්බන්ධ කරුණු
b. ඉඩම් / නිවාස හිමියන්, කුලී නිවැසියන් ඉවත් කිරීම සම්බන්ධ කරුණු
c. ණය පියවීම සම්බන්ධ ගැටලු
d. හානිපූරණය හා වන්දි
e. පවුල් ආරවුල්

1.9 **පහත සඳහන් ඒවා අතුරෙන් ඕනෑම දෙකක්:**

a. චෙක්පතක් ලිඛිත පත්‍රයක් ලෙස පැවතිය යුතුය.
b. චෙක්පත් තුළ පැවතිය යුත්තේ ගෙවීම සඳහා කොන්දේසි විරහිත අණ කිරීමකි.
c. චෙක්පත් අදාළ ගනුදෙනුකරු විසින් ඔහුගේ බැංකුවට අණකර තිබේ.
d. ගනුදෙනුකරුවන් විසින් චෙක්පත් අත්සන් කළ යුතුය.
e. චෙක්පතකට ගෙවනු ලබන්නේ ඉල්ලූ විටදී පමණි.
f. චෙක්පත තුළ අදාළ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය නිශ්චිතව දැක්විය යුතුය.
g. අදාළ ගෙවීම කළ යුතු පුද්ගලයා කවුරුන්ද යන්න නිශ්චිතව දක්වා තිබිය යුතුය.
h. ගිණුම්හිමියා විසින් හෝ බැංකුවේ ගනුදෙනුකරු විසින් චෙක්පත්වල නියමිත පරිදි දිනය යෙදිය යුතුය.
i. රේඛනය කිරීමට අදාළ නීති චෙක්වලට අදාළ වේ.
j. චෙක්පත් සම්බන්ධව අදාළ වන පාර්ශ්වයන් තුන වන්නේ, අණකරු (Drawer), අණ ලද්දා (Drawee) සහ ආදායකයා (Payee) වේ.

1.10 වාර්ෂික නිවාඩු දින 07 **(මුළු ලකුණු 20)**

***A* කොටසෙහි අවසානය.**

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.
(මුළු ලකුණු 25)

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

මෙය අපරානුමැතියෙන් (පසුව අනුමත කිරීමෙන්) නියෝජ්‍යත්වය පැන නැගීමයි. ප්‍රධානියා විසින් දෙන අනුමැතිය පමණක් අපරානුමැතියෙන් නියෝජ්‍යත්වය පැන නැගීමට හේතු නොවන අතර අපරානුමැතියෙන් පැන නගින නියෝජ්‍යත්වය එක්තරා රීතීන් මගින් පාලනය වේ.

නියෝජිතයා ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී තමා නියෝජිතයෙකු බවට ප්‍රකාශිතවම සඳහන් කොට ගිවිසුමට එළඹිය යුතුය. නියෝජිතයා විසින් ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී ප්‍රධානියා වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් ගිවිසුමට එළඹ තිබිය යුතුය.

එසේ නොමැතිව ගිවිසුමකට එළඹ ඇති විටක ප්‍රධානියා පසුව අනුමැතිය දුන්නේ වුව ද අපරානුමැතියෙන් නියෝජ්‍යත්වය පැන නොනඟී.

**සුනිල්** විසින් **පියල්ට** සීනි තොගය එක්තරා මිලකට ගන්නට අවසර දුන් අතර පැන නැගුණු තත්ත්වය මත **පියල්** ඔහුගේ අධිකාරිය ඉක්මවා යමින් සීනි තොග ඉහළ මිලකට ලබාගන්නා ලදී.

මෙම අවස්ථාවේ දී **පියල්** ඔහුගේ නමින් සීනි මිලදී ගැනුණු අතර සිය ප්‍රධානියා ලෙස **සුනිල්ව** හෙළිදරව් කර තිබුණේ නැත.

**පියල් සුනිල්ගේ** නියෝජිතයෙකු ලෙස ගිවිසුමට එළඹී නැති නිසා **සුනිල්** හා **නිමල්** අතර අපරානුමැතියෙන් නියෝජ්‍යත්වයක් පැන නොනඟී.

අදාළ වන නඩු තීන්දුව : *Keighley Maxted and Co. Vs Durant*

***(ලකුණු 05)***

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**පහත මූලධර්ම අතුරෙන් ඕනෑම දෙකක්:**

**A.** අවංකභාවය

1. අවංකභාවය යනු වෘත්තිකයකු සතු සදාචාරාත්මක ස්ථාවරභාවයයි.
2. තීරණ ගැනීමේදී අවංකව සහ සෘජුව කටයුතු කළ යුතුය.
3. වෘත්තිකයා සාධාරණ සහ සත්‍යවාදී විය යුතු අතර, අන් අයගෙන් සත්‍යය වසන් කිරීමෙන් වැළකිය යුතුය.
4. තමා සමඟ එකට කටයුතු කරන සියලු හවුල්කරුන්ට ගැළපෙන ආකාරයකට නොවෙනස්ව සංග්‍රහ කිරීමත්, විවිධ හවුල්කරුවන්ට / සගයන්ට විවිධ ආකාරයන්ගෙන් සංග්‍රහ නොකිරීමටත් වෘත්තිකයා කටයුතු කළ යුතුය.

**B.** අරමුණුගතභාවය

1. වෘත්තිකයකු විසින් දෙනු ලබන විනිශ්චයන්, සෑම විටදීම, භාවාත්මක හෝ පුද්ගලික පක්ෂපාතීභාවයන්ගෙන් බලපෑමට ලක් නොවිය යුතුය.
2. ඔහු පක්ෂග්‍රාහී නොවිය යුතු අතර, රුචිකත්වයන් පිළිබඳව වන සට්ටනයට, ඔහුගේ වෘත්තීයමය තීරණවලට බලපෑම් කිරීමට ඉඩලබා නොදිය යුතුය.
3. පුද්ගලික පක්ෂග්‍රාහීත්වයන්ට "තීරණ ගැනීමේ ක්‍රියාදාමය තුළට ප්‍රවේශවීමට ඉඩ ලබා නොදී තීරණයකට එළඹීමේදී, පවතින සෑම සම්පතක්ම හා තොරතුරක්ම භාවිතා කළ යුතුය.

**C. ශිල්පීය ශක්‍යතාවය / නිපුණතාව**

1. ශිල්පීය ශක්‍යතාවය යනු, වෘත්තිමය වශයෙන් පිළිගත් මට්ටමට අනුව, ස්ථිර වශයෙන් සේවය සැපයීමට ඇති හැකියාවයි.
2. සේවය පිරිනමන විටදී, වෘත්තිකයකු විසින්ත නූතන සංවර්ධනයන්, ව්‍යවස්ථාවන්ට සහ තාක්‍ෂණ-ික විධික්‍රමයන්ට අනුගතව, සේවාදායකයන් හට නිපුණතාවයෙන් යුතු, නිසි වෘත්තිමය සේවාවක් ලැබෙන බවට සහතික කිරීමට, දැනුම සහ හැකියාව පවත්වාගෙන යා යුතුය.
3. ඔහු විසින්, ඔහුගේ සේවාදායකයන් හට සේවය සැපයීමේදී, යොදා ගනු ලබන විධික්‍රම සහ වෘත්තිමය ප්‍රමිතීන්ට අනුගතව, කාර්යක්‍ෂමව කටයුතු කළ යුතුය.

**D. නිසි අවධානය**

1. නිසි අවධානය යනු, විවිධ තත්ත්වයන් යටතේ, යුක්තිසහගත මනුෂ්‍යයකු වෙතින් අපේක්‍ෂා කරනු ලබන "අවධානයේ මට්ටමයි" ඉන් ගම්‍යමාන වන්නේ, දෙනු ලබන අවස්ථාවක් තුළ ප්‍රඥාන්විත වෘත්තිකයකු වෙතින් අපේක්‍ෂා කරනු ලබන ප්‍රයත්නයන්ය.
2. නිසි අවධානය පිළිබඳ මූලධර්මය තුළින් අනලස්බව පිළිබඳ මූලධර්මය පැන නඟියි. මින් අදහස් වන්නේ, විශේෂ අවස්ථාවක් සඳහා දැනුම, නිසි අවධානයෙන් හා සැළකිල්ලෙන් යුතුව, ස්ථාවර සහ ප්‍රවේශම්සහගතව යෙදීමයි.

**E. රහස්‍යභාවය**

1. මෙය, වෘත්තීමය හා ව්‍යාපාරික සබඳතාවයන්හි ප්‍රතිඵලයක් වශයෙන් අත්පත් කරගනු ලබන, තොරතුරු නිසි අධිකාරී බලය නොමැතිව තුන්වන පාර්ශවයන්ට අනාවරණය නොකිරීමට වෘත්තිකයකු කටයුතු කිරීමේ අවශ්‍යතාවයයි. (එසේ වුවත්, එවැනි රහස්‍යමය තොරතුරු අනාවරණය කිරීම පිණිස නෛතික හෝ වෘත්තීමය යුතුකමක් පවතින්නේ නම් පමණක්, ඔහුට එලෙස අනාවරණය කළ හැකිය.)
2. වෘත්තිමය හා ව්‍යාපාරික සබඳතාවයන්හි ප්‍රතිඵලයක් අත්පත් කර ගත් රහසිගත තොරතුරු, ඔහු විසින් තමන්ට පුද්ගලික වාසි හා ප්‍රයෝජන ලබා ගැනීම පිණිස, ප්‍රයෝජනයට නොගත යුතුය.

**F. ස්වාධීනතාවය**

1. ස්වාධීනභාවයට මුහුණත් දෙකක් ඇත.
   a. මනස තුළ ඇති ස්වාධීනතාවය
   b. පෙනෙන්නට තිබෙන ස්වාධීනතාවය
2. මනසේ ස්වාධීනතාවය යනු, වෘත්තිකයකුහට කිසිදු ආකාරයක බලපෑමකින් තොරව, තමාගේ විනිශ්චක තීරණයක් ප්‍රකාශ කිරිමට ඔහුට ඉඩ සලසා දෙනු ලබන මනසේ ස්වභාවයයි.
3. මනසේ ස්වාධීනතාවය පවතින්නේ, තනි පුද්ගලයන්ට අවංකව, පක්‍ෂග්‍රාහීත්වයෙන් සහ වෘත්තීය සංශයවාදයෙන් තොරව ක්‍රියා කිරීමට හැකියාව ලැබෙන්නේ නම් පමණකි.
4. පෙනෙන්නට තිබෙන ස්වාධීනතාවය යනු, ඔහු නිරීක්‍ෂණය කරන අනික් අයට, ඔහුගේ මනසේ ඇති ස්වාධීනතාවය පැහැදිලිව පෙනීයාමයි. තුන්වන පාර්ශවයන් විසින් පක්‍ෂග්‍රාහීත්වයෙන් තොරව, ස්වාධීන තීරණයක් ලෙසින් තීරණය දැකිය හැකි විය යුතුය.

***(ලකුණු 05)***

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

80 වෙනි වගන්තියේ නියමයන්ට අනුව, බැංකුකරු විසින් සද්භාවයෙන් යුතුව, නොසැලකිල්ලෙන් තොරව රේඛනය කිරීම්වලට අනුගතව, රේඛනය කරන ලද චෙක්පතක් සම්බන්ධව ගෙවීම් කර ඇති විටදී අදාළ මුදල් අධිකාරී බලයක් රහිත පුද්ගලයෙකු විසින් ලබාගෙන තිබුණා වුවත්, චෙක්පතේ සැබෑ හිමිකරුගෙන් බැංකුකරු ආරක්ෂා කරනු ලැබ ඇත.
සාමාන්‍ය රේඛනය සහිත චෙක්පත් භාරගන්නා බැංකුව එම චෙක්පතේ අගය ඕනෑම බැංකුකරුවෙකුගේ ගිණුමට ගෙවිය යුතුය. සාමාන්‍ය රේඛනයට වඩා වෙනස් වන එවන් චෙක්පතකට අගය කවුන්ටරයෙන් ගෙවීමක් කළහොත්, සැබෑ අයිතිකරුට පාඩුවක් සිදු වුවහොත් එය අයකර ගැනීමට බැංකුව වගකීමට බැඳේ.
මෙය ධාරක බිලක් වන අතර ඕනෑම පුද්ගලයෙකුට එය තැන්පත් කිරීමට හෝ මුදල් කරගැනීමට හැකිය. රේඛිත චෙක්පතකට බැංකුව විසින් රේඛනයට අනුකූල නොවන ලෙස ගෙවා ඇතත්, චෙක්පත දරන්නා පිටසන් කිරීම නිසා සත්‍ය අයිතිකරුට පාඩුවක් නොවේ.
එමනිසා Aට එම මුදල බැංකුවෙන් අය කරගැනීමේ හැකියාවක් නොමැත.
අදාළ වන නඩු තීන්දුව : *Mercantile Bank of India Vs Ratnam* **(ලකුණු 05)**

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

සමාගමක් සංස්ථාගත කිරීමේදී, එම සමාගම එහි කොටස්හිමියන්ගෙන්, අධ්‍යක්ෂවරුන්ගෙන් සහ වෙනත් නිලධරයන්ගෙන් වෙන්වූ කෘතීම නෛතික තැනැත්තෙකු බවට පත්වේ. එමනිසා, සමාගමට තමා විසින් නඩු පැවරීමටද තමාට එරෙහිව නඩු පවරනු ලැබීමටද හැකියාව ඇත. ඊටත් වඩා සමාගමට ස්වකීය නාමයෙන් කොන්ත්‍රාත් සිදුකිරීමට, ව්‍යාපාරික කටයුතු සිදුකිරීමට, ස්වකීය දේපළක් පවත්වාගැනීමට හා මුදල් තබාගැනීමට මෙන්ම බැංකු ගිණුම් විවෘත කිරීම හා මුදල් ණයට ගැනීමට හැකියාව ඇති ආයතනයක් ලෙස පිළිගනු ලැබේ. අනෙක් අතට එයට පුද්ගලයෙකු ලෙස ගිවිසුම්වලට එළඹීමේ හැකියාව ද ඇත.

**(ලකුණු 05)**

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

ලාභ උපයා ගැනීමේ අරමුණ ඇතිව එකට එක්ව ව්‍යාපාරික කටයුතු කරනු ලබන තැනැත්තන් අතර ඇති කරගන්නා සම්බන්ධතාව හවුල් ව්‍යාපාරයක් ලෙස සැලකේ. හවුල් ව්‍යාපාර ගිවිසුම මගින් හවුල්කරුවන්ගේ අයිතීන් හා වගකීම් තීරණය වේ. එවන් ගිවිසුමක් නැති කල්හි හවුල් ව්‍යාපාර ආඥාපනත යෙදේ. මෙම පනතට අනුව හවුල්කරුවන් සත්‍ය ගිණුම් හා කිසියම් කෙනෙකුගේ ගනුදෙනු සම්බන්ධ පූර්ණ විස්තර අනෙකුත් හවුල්කරුවන්ට හෙළිදරව් කළ යුතුය. අනෙක් අතට හවුල්කරුවා, ඔහු විසින් හවුල් ව්‍යාපාර ගනුදෙනු ඇසුරෙන් ජනනය කරගන්නා සියලුම වාසිවල තොරතුරු හෙළිදරව් කළ යුතුය.
මෙම නඩුවට අදාළව අමල් ඉපයූ රු. 50,000/- ක වට්ටම හෙළිදරව් නොකළ අතර රු. 50,000/- ක රහස් ලාභයක් උපයා ඇත. මෙය හවුල්කරුවන්ට ඇති වගකීම් කඩකිරීමකි. එමනිසා හවුල් ව්‍යාපාරයට සිය ලාභ කොටස හවුල් ව්‍යාපාරයෙන් නැවත ලබාගත හැකිය. ඒ අනුව, රමල්ගේ නෛතික අයිතිය ලැබේ.
අදාළ වන නඩු තීන්දුව: *Bentely Vs Craven (1853)*

*Pathirana Vs Pathirana*

**(ලකුණු 05)**

***B*** **කොටසෙහි අවසානය.**

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.
(මුළු ලකුණු 30)

### 7 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a)

මෙය භාණ්ඩ විකිණීම පිළිබඳ ව්‍යංග කොන්දේසි සම්බන්ධවය. භාණ්ඩ විස්තරයක් මගින් මෙන්ම සාම්පලයක් මගින් ද විකුණනු ලබන විට එම භාණ්ඩ විස්තරයට මෙන්ම සාම්පලයට ද අනුරූප විය යුතුය. විකුණුම්කරු භාණ්ඩ විකිණීමේදී ගුණත්වය අන්තර්ගතය යනාදිය විස්තර කරයි නම් භාණ්ඩ එම විස්තරය හා අනුරූප විය යුතු අතර නැතහොත් ව්‍යංග කොන්දේසි බිඳේ.

රාජා, රාණිට ආලේපන පැකට්ටුවක් සාම්පලයක් හා විස්තරයක් සමග විකිණීමට එකඟ වී ඇත. භාණ්ඩය සාම්පලය සමග එකඟ වුවත්, විස්තරය සමග සමාන නොවුණි.

ආලේපන පැකට්ටුව 'මුහුදු ඛනිජ මිශ්‍රයි' යන විස්තරයට අනුරූප නොවුණු නිසා රාණි, ගිවිසුම නතර කිරීම, භාණ්ඩ භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම, වන්දි ලබාගැනීම වැනි ප්‍රතිකර්මවලට හිමිකම් කියයි.

අදාළ වන නඩු තීන්දුව : *Nichol Vs Godts*

***(ලකුණු 05)***

b)

*පහත ආකාරවලින් ඕනෑම එකක් යොදාගත හැකිය. මෙවන් ගනුදෙනුවක දී වඩාත් සුදුසුම ගෙවීමේ ආකාරය වන්නේ ණයවර ලිපිය හා එකතු කරගැනීමේ එකඟතාවන්ය. අනෙකුත් ක්‍රම ඉතා කලාතුරකින් යොදා ගැනේ.*

**1.** ණයවර ලිපි (වාර්තාගත ණය, බැංකුකරුගේ වාණිජ ණය)

- බැංකුවක් විසින් නියම කරන ලියකියවිලි භාරදුන් පසු ගෙවීම් කිරීමට එකඟවන කොන්දේසියක් ලෙස ණයවර ලිපි නිර්වචනය කළ හැකිය.
- මෙය 'සුරක්ෂණය' ලෙස ලබාගත් ලියවිලි බැංකුව විසින් ඇපයට තබාගෙන එක්තරා නිශ්චිත ගනුදෙනුවක් සිදුකිරීමේ අන්තර්ජාතික වෙළෙඳාම් සිදු කිරීමේ ආකාරයකි.
- ණයවර ලිපි සූදානම් කිරීමේදී බැංකුවක් (සාමාන්‍යයෙන් මෙය ආනයනකරුගේ රටේ ඇති බැංකුවකි) අපනයනකරු අවශ්‍ය ලියවිලි නිශ්චිත කාලසීමාවක දී ඉදිරිපත් කළහොත් නැව්ගත කළ බඩුවලට ගෙවීම සිදු කරයි. (ලියවිලිවලට උදාහරණ - නෞභාරපත, රක්ෂණ සහතිකය, ප්‍රතිෂ්ඨාපන සහතිකය)
- ණයවර ලිපි සම්බන්ධ එකී පරිචයන් පිළිබඳ ප්‍රකාශනය ණයවර ලිපි පාලනය හා ක්‍රියාත්මක කරන නීති සමුදායකි.

**2.** අයකරගැනීමේ එකඟතා

- මුදල් අයකර ගැනීම පිණිස වන එකඟතාවන්ට එළඹෙන්නේ විකුණුම්කරුගේ ස්ථානයේ දී විකුණුම් මිල තීරණය වන විටදීමය.
- විකුණුම්කරු විසින් තම බැංකුවට (සම්ප්‍රේෂණය කරන බැංකුව) නෞකා ලියවිලි භාරදෙන අතර බැංකුව විසින් එකී ලියවිලි ගැනුම්කරුගේ බැංකුව (සංග්‍රාහක බැංකුව) වෙත යවයි.
- එවිට සංග්‍රාහක බැංකුව නෞභාර පත්‍රය ගැනුම්කරුට ඉදිරිපත් කර එය පිළිගන්නා ලෙස ඉල්ලයි.

- ගැනුම්කරු එය පිළිගත් පසු සංග්‍රාහක බැංකුව විසින් නෞකා ලියවිලි ඔහුට ලබාදෙන අතර එතුළින් මුල් නෞභාර බිල්පත ඔහුට අහිමි වන අතර නැව වරායට ළඟා වීමෙන් අනතුරුව භාණ්ඩ අත්පත් කරගැනීමට එමගින් හැකි වේ.
- මේවා පාලනය වන්නේ අන්තර්ජාතික වාණිජ මණ්ඩලය මගින් පනවා ඇති වාණිජ ලියවිලි එකතු කරගැනීම උදෙසා වන ඒකරූපී රීතීන්ට අදාළවය.

**3. විවෘත ගිණුම් හරහා ගෙවීම**

- මෙහිදී සිදුවන්නේ අනාගතයේ නියමිත දිනයක දී ගැනුම්කරු විසින් විකුණුම්කරුගේ ඉන්වොයිසියට මුදල් ගෙවීමේ එකඟතාවය මත විකුණුම්කරු විසින් ගැනුම්කරුට භාණ්ඩ සහ අවශ්‍ය සියලුම නෞකා හා වාණිජ ලියවිලි ඍජුව නැව් මාර්ගයෙන් යැවීමයි.
- සාමාන්‍යයෙන් මෙම ක්‍රමය භාවිත වන්නේ ස්ථාවර හා විශ්වසනීය වෙළෙඳුන් අතර වේ.

**4. අත්තිකාරම් ගෙවීම**

- මෙය අන්තර්ජාලය හරහා විද්‍යුත් මගින් කෙරෙන කඩදාසි රහිත වෙළෙඳාමයි. ඇතැම් අවස්ථාවන්හි දී භාණ්ඩ ලබාදීමට පෙරාතුව ආනයනය කරන්නා විසින් අපනයනකරුවාට යම් අත්තිකාරම් මුදලක් ගෙවන අවස්ථා ඇත.
- මෙහිදී අත්තිකාරම් ලෙස මුළු මුදලම හෝ කොටසක් ලබාගැනීමට අපනයනකරුවාට හැකියාවක් පවතී.

**5. විද්‍යුත් වාණිජ්‍යය**

- කඩදාසි මත පදනම් වූ සාම්ප්‍රදායික ක්‍රමය කාර්යක්ෂමභාවයෙන් අඩු යල්පැනගිය ක්‍රමයකි.
- විද්‍යුත් වාණිජ්‍යයේ වාසි
  a. අඩු පිරිවැය
  b. ඉක්මන් කාර්යක්ෂම සැපයුම
- විද්‍යුත් වාණිජ්‍යයේ අවාසි
  a. ආරක්ෂා මට්ටම අසතුටුදායකයි.
  b. අන්තර්ජාලය හරහා ගෙවීම් විස්තර යැවීම අවදානම්සහගතය.

***(මුළු ලකුණු 10)***

## 8 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a)

රක්ෂණ ගිවිසුම 'රක්ෂණීය හිමිකමක්' ඔස්සේ තහවුරු විය යුතු අතර යම්හෙයකින් රක්ෂණ ගිවිසුමක රක්ෂණීය හිමිකම නොමැති නම් එම ගිවිසුම වලංගු නොවේ. රක්ෂණය ලබාගැනීමට අපේක්ෂා කරන පුද්ගලයාට එම රක්ෂණයට අපේක්ෂිත විෂය වස්තුවේ පැවතීම මූල්‍යමය වාසියක් ගෙනදිය යුතු අතර එයට හානි වීම මගින් මූල්‍යමය අවාසියක් සිදුවිය යුතුය.

*Griffith Vs Fleming* නඩුවට අනුව **අමාලිට** ඇයට හා ඇයගේ කාලත්‍රයාට රක්ෂණීය හිමිකමක් ලබාගැනීමට අයදුම් කිරීම සාර්ථක වනු ඇත. තමන්ගේ ජීවිතය සම්බන්ධව රක්ෂණීය හිමිකමක් තමන්ට ඇති අතර එක් එක් කාලත්‍රයාට අනෙකුත් කාලත්‍රයාගේ ජීවිතය සම්බන්ධව ද රක්ෂණීය හිමිකමක් පැවතීම මීට හේතුවයි.

***(ලකුණු 05)***

b)

*Evans Vs Crooks* අනුව සහෝදරයෙකු හෝ සහෝදරියකගේ ජීවිතයක් සම්බන්ධව අනෙක් සහෝදරයාට හෝ සහෝදරියට රක්ෂණීය හිමිකමක් නැති බව පෙන්වන අතර සුනාලි විසින් සිය වැඩිමහල් සහෝදරයා වෙත ජීවිත රක්ෂණයක් ලබාගැනීමට උත්සාහ දරයි. *Howard Vs Refuge Friendly Society* නඩුවට අනුව රක්ෂණ හිමිකමක් නොමැති වීම නිසා සුනාලිට තම දෙමව්පියන්ට ජීවිත රක්ෂණ ආවරණයක් ලබාගැනීමට නොහැකි වේ.

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 10)**

## 9 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a) i)

1. තහනම් කරන ලද වෙළෙඳ පරිචයන් පාලනය කිරීම සහ සහමුලින් ම අවසන් කිරීමට, ව්‍යාපාර අතර 'මිල' සම්බන්ධ එකඟතා විධිමත් කිරීමට, මිල තත්ත්වය (මිල පාලනය) කිරීමට, දේශීය ආර්ථිකය සහ අන්තර්ජාතික වෙළෙඳාමට හානි සිදු කරන අහිතකර තරගකාරීත්වය වැළැක්වීමට කටයුතු කිරීම.
2. තරගකාරීත්වයට එරෙහි පරිචයන් සහ ඒකාධිකාරී බලය අයුතු ලෙස භාවිත කිරීම විමර්ශනය හෝ ප්‍රශ්න කිරීම (තරගකාරීත්වයට එරෙහි පරිචයන් යනු යම් පුද්ගලයෙකු හෝ පුද්ගල සමූහයක් එක්ව සමාගම් අතර ඇති තරගය අයුතු ලෙස වළක්වමින් ඔවුන් වාසිදායක පරිදි ඔවුන්ගේ වෙළෙඳපොළ කොටස් හෝ ලාභ ඉපැයීම පවත්වා ගැනීමයි. මෙහිදී භාණ්ඩ හෝ සේවා අඩු මිලකට සැපයීම හෝ නිසි ප්‍රමිතියෙන් යුක්ත වීම සිදු නොවේ.)
3. භාණ්ඩ හා සේවා සපයන්නන් අතර ඵලදායී තරගකාරීත්වයක් පවත්වාගෙන යාම සහ ඊට අනුග්‍රහය දැක්වීම.
4. මිල, භාණ්ඩවල උපයෝගිත්වය, ප්‍රමිතිය සහ විවිධත්වයක් සැපයීම වැනි ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, භාණ්ඩ ගැනුම්කරුවන්ගේ සහ අනෙකුත් භාණ්ඩ පරිභෝජනය කරන්නන්ගේ අයිතීන් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම.
5. මිලදී ගැනීම සඳහා ඇති භාණ්ඩ සහ සේවාවල ප්‍රමිතිය, ප්‍රමාණය, ශක්‍යතාවය, පිරිසිදු බව, මිනුම් දර්ශක සහ මිල පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කිරීම.
6. පනතේ දක්වා ඇති කරුණු පිළිබඳව වන ගැටලු විමර්ශනය කිරීම.

**(ලකුණු 04)**

ii) *පාරිභෝගික කටයුතු අධිකාරිය මගින් වෙළෙන්දන් වෙත පනවන ලද පහත සඳහන් ඕනෑම වගකීම් දෙකක් පිළිගත හැකිය.*

1. ව්‍යාපාර ස්ථානයේ තබා ඇති භාණ්ඩවල උපරිම සිල්ලර හා තොග මිල ප්‍රදර්ශනය කිරීම. (භාණ්ඩයේ හෝ ඇසුරුමේ මිල සඳහන් වී ඇති භාණ්ඩ මේ යටතට වැටේ.)
2. විකුණන භාණ්ඩ සඳහා රිසිට්පතක් නිකුත් කිරීම.
3. අධිකාරිය සමගින් ලියාපදිංචි වීම.
4. වෙළෙඳාමේ දී කිසිදු පාරිභෝගිකයෙකු නොමග යැවීම හෝ රැවටීම සිදු නොකළ යුතුය.
5. තමා විකිණූ භාණ්ඩවල වැරදි නිදර්ශන ඉදිරිපත් නොකිරීම.
6. අධිකාරිය සමගින් ලියාපදිංචි වීම.

**(ලකුණු 02)**

b)

*පහත අවස්ථාවල දී සේවකයාට ඔහුගේ / ඇයගේ EPF ලබාගැනීමට අවස්ථාව හිමි වේ. (අවස්ථා 4ක් ලිවීම උත්තරය ලෙස පිළිගැනීම යෝග්‍යය.*

a. විශ්‍රාමයාමේ වයසට පැමිණීමෙන් අනතුරුව (පිරිමි පුද්ගලයකු නම් අවුරුදු 55 ක් ද කාන්තා සේවකයකු නම් අවුරුදු 50 ක්ද වේ)

b. විවාහය නිසා කාන්තා සේවකයන් සේවයෙන් ඉවත්ව යාමේදී (ඉවත් වීම) අයදුම්පත භාරදීමෙන් මාස තුනක් ඇතුළත ඇයට විවාහ වීමට සිදුවන අතර විවාහයෙන් අවුරුදු 5 ක් තුළ සේවයෙන් තුළින් ඉවත් විය යුතුය.

c. ස්ථිර වශයෙන්ම හෝ සම්පූර්ණයෙන්ම ආබාධිත වුවහොත් (මෙහිදී වෛද්‍ය ආඥා පනතේ නිසි පරිදි ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයකුගේ සහතිකය අවශ්‍ය වේ. ඔහුගේ නිර්දේශ අවශ්‍ය වේ)

d. නැවත පැමිණීමේ බලාපොරොත්තුවක් රහිතව ලංකාවෙන් පිටවන්නේ නම් (සංක්‍රමණය වීම)

e. පළාත් පාලන සේවය තුළ හෝ රජයේ සේවය තුළ විශ්‍රාම යා හැකි පත්වීමක් ලබාගෙන තිබීම.

f. රජයේ සංස්ථාවක හෝ රජය මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපාරයක සේවකයෙකු සේවය හැර යන විට අදාළ අර්ථසාධක මුදල ලබාගත හැකිය.

g. අරමුදලේ සාමාජිකයකුගේ මරණය සිදුවූ විට ඔහු විසින් නිර්දේශ කරන ලද පුද්ගලයකුට අදාළ ප්‍රතිලාභ ලබාගත හැක.

**(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

**C කොටසෙහි අවසානය.**

## D කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a) i) මෙය ගිවිසුම් නීතිය මත පදනම් වී ඇත. පාර්ශ්වයන් ද්විත්වයක් හෝ ඊට වැඩි පිරිසක් අතර ඇති වන එකඟතාවය ගිවිසුමක් ලෙස අර්ථ දැක්විය හැකිය. ගිවිසුමක් ඇති කරන මූලිකම අංග දෙකක් ලෙස අර්පණය හා ප්‍රතිග්‍රහණය දැක්විය හැකිය.

අර්පණකරු විසින් අර්පණලාභියාට, නිශ්චිත කොන්දේසි මත සිදු කරන නිශ්චිත පොරොන්දුවක් අර්පණය ලෙස දැක්වේ. අර්පණයක් ලිඛිතව, වාචිකව හෝ ව්‍යංගයෙන් සිදු කළ හැකිය. මෙම අවස්ථාවේදී **මාලා** විසින් ඇයගේ නිවස රුපියල් මිලියන 2කට කුමාරිට විකිණීමට අර්පණයක් සිදු කර ඇත.

ප්‍රතික්ෂේප කිරීමෙන් අර්පණයක් අවසානයට පත්විය හැකිය. අර්පණලාභියා අර්පණය ප්‍රතික්ෂේප කළ විට එය අවසානයට පත් වේ. ප්‍රතික්ෂේප කිරීම බලාත්මක වීමට නම් අර්පණකරුට එය දැනුම්දිය යුතුය. ප්‍රති අර්පණයක් කිරීම හරහා ද අර්පණය ප්‍රතිෂේප කළ හැකිය. නව අර්පණයක් කිරීම හෝ අර්පණයේ කොන්දේසි නොසලකා එය ප්‍රතිග්‍රහණය යන ආකාර දෙකෙන් ප්‍රතිඅර්පණය සිදුවිය හැකිය.

මෙම නඩුවට අනුව නිවස රුපියල් මිලියන 2කට විකුණන බවත්, නමුත් ගෙවීම වාරික 4කින් සිදු කරන බවත් පවසමින් ප්‍රතිඅර්පණයක් සිදු කර ඇත. මෙහිදී වාරික මගින් ගෙවන බව පවසන බව සඳහන් කරමින් ප්‍රතිඅර්පණයක් සිදු කිරීම නිසා නිවස රුපියල් මිලියන 2කට විකිණීමේ මුල් අර්පණය ප්‍රතික්ෂේප විය. මේ අනුව **මාලා හා කුමාරි** අතර වලංගු ගිවිසුමක් නොමැත. මෙම ප්‍රතිග්‍රහණය වලංගු වීමට නම් **කුමාරි** විසින් එක්වරම මුදල් ගෙවීමට එකඟ විය යුතුය. **මාලා** ප්‍රතිඅර්පණය ප්‍රතික්ෂේප කර ඇත.

අවසානයේ දී **කුමාරි** විසින් වලංගු අර්පණයක් සිදු කළ ද **මාලා** විසින් එය ප්‍රතිග්‍රහණය කර නොමැත. එමනිසා **මාලා** හා **කුමාරි** අතර වලංගු ගිවිසුමක් නොපවතී.

*Hyde Vs Wrench*

*Neal Vs Merett*

***(ලකුණු 08)***

ii)

මෙය ගිවිසුම් නීතිය මත පදනම් වේ. 'ව්‍යර්ථ වීම මගින්' වැනි කිසියම් ගිවිසුමක් අවලංගු විය යුතු ආකාර විශාල ප්‍රමාණයක් පවතී.

'ගිවිසුම ව්‍යර්ථ වීම මගින් නිමා වීම' යනු ගිවිසුම නිර්මාණය වීමෙන් පසුව, ගිවිසුමේ කිසිඳු පාර්ශ්වයකගේ වරදක් නොවන ක්‍රියාවක් හෝ සාධාරණ ලෙස අනාගතයේ දී සිදුවේයයි උපකල්පනය කළ නොහැකි ක්‍රියාවක් හේතුවෙන් ගිවිසුමක් අවසාන වීමයි.

දෙන ලද සිදුවීමට අනුව ආරක්ෂක හේතුවක් මත වාර්ෂික පෙරහැර නොපැවැත්වීම යන ගිවිසුමේ මුඛ්‍ය අරමුණ සිදු නොවීම නිසා ගිවිසුම ව්‍යර්ථ වී ඇත. එමනිසා පෙරහැර බැලීම සඳහා ගත් මහල ප්‍රයෝජනවත් නොවේ. ගිවිසුම ව්‍යර්ථ වීමෙන් අවසන් වන නිසා පාර්ශ්ව 2කම ඔවුන්ගේ වගකීම්වලින් නිදහස් වේ. මෙම නිසා මහල වෙන් කිරීමේ ගාස්තුව **පියල්**ට නැවත අයකරගත හැකිය.

*(Krell Vs Henry)*

***(ලකුණු 03)***

b) i)

**කුසල් හා මායා** අතර මෙම ගිවිසුම පදනම් වී ඇත්තේ අනාගත භාණ්ඩ මතය. මෙම භාණ්ඩ විකුණුම්කරු විසින් නිෂ්පාදනය කිරීම හෝ අත්පත් කරගැනීම කරන්නේ භාණ්ඩ විකිණීමේ ගිවිසුමට ඇතුළත් වූ පසුය.

ඔවුන් භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට එළඹී ඇති අතර වලංගු ගිවිසුමකට එළඹුණු පසු ස්කෑනරය (scanner) ආනයනය කර අත්පත් කරගැනීම කුසල් විසින් සිදු කරනු ඇත. අනාගත භාණ්ඩ, ගිවිසුමට ඇතුළු වන විට නොපවතින එමෙන්ම භුක්තියේ නොමැති භාණ්ඩ අනාගත භාණ්ඩ වේ. එමනිසා **කුසල් හා මායා** අතර භාණ්ඩ විකිණීම සම්බන්ධ වලංගු ගිවිසුමක් පවතී.

***(ලකුණු 03)***

ii)

**රවිඳු හා කුසල්** අතර ගිවිසුම පදනම් වී ඇත්තේ පවතින භාණ්ඩ මතයි. පවත්නා භාණ්ඩ යනු භාණ්ඩ විකිණීමේ ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී විකුණුම්කරුට අයත්ව තිබූ හෝ භුක්තියේ තිබූ භාණ්ඩයි.

මේ අනුව **රවිඳු හා කුසල්** අතර වලංගු භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් පවතී.

***(ලකුණු 03)***

iii)

අලුත් අවුරුදු උත්සවයට දින 3කට පෙර මුද්‍රණ යන්ත්‍රය දයාල්ට බාරදීමට **කුසල්ට** නොහැකි විය. එමනිසා ගැනුම්කරුවකු ලෙස දයාල්ට පහත නීතිමය අයිතීන් හා ප්‍රතිකර්ම හිමි වේ.

**භාණ්ඩ භාර නොදීම සම්බන්ධව නඩු පැවරීම**

විකුණුම්කරු විසින් වැරදි ආකාරයකින් හෝ නොසැලකිලිමත් ලෙස කටයුතු කරමින් ගැණුම්කරුට භාණ්ඩ භාරදීම ප්‍රතික්ෂේප කරන විටක විකුණුම්කරුට විරුද්ධව නඩුවක් පවරා සිදු වූ අලාභ අයිතිකරගත හැක.

**මිල අයකර ගැනීමට සඳහා නඩු පැවරීම**

ගැණුම්කරු විසින් විකුණුම්කරුට ගෙවන ලද මිල, නඩුවක් පවරා ආපසු අයකර ගත හැක.

**ගිවිසුම එලෙසම ඉටු කිරීමේ ආඥාවක් ලබා ගැනීම.**

විකුණුම්කරු විසින් ගිවිසගත් ලෙස ගැණුම්කරුට භාණ්ඩ භාරදීම පැහැර හරිනු ලබන විට ගිවිස ගත් පරිදි ගිවිසුම ඉටු කරන ලෙසට දක්වමින් විකුණුම්කරුට එරෙහිව ගැණුම්කරුට අධිකරණයෙන් ගිවිසුම එලෙසම ඉටු කිරීමේ ආඥාවක් ලබා ගත හැක.

***(ලකුණු 05)***

***(මුළු ලකුණු 25)***

***D* කොටසෙහි අවසානය.**

***Notice :***

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the “Only” answers, or, for that matter even as “Model Answers”.
The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2018 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*
*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*